# 21 ධම්ම පදය III

## 21.1 දැහැමියාට දෙවු ලෝ හයෙන් ම ඇරයුම්

සැවැත් නුවර ධම්මික නම් උපාසකවරයෙක් විසී ය. ඔහුට පුත්තු සත් දෙනෙක් හා දූවරු සත් දෙනෙක් ද වූහ. මේ උපාසකතුමා සිල්වත් ය, ගුණවත් ය, නිතර දන් දෙයි. සම්පත් සතුටින් බෙදා හදා ගෙන භුක්ති විඳියි. ඔහුගේ අඹුදරුවෝ ද එසේ ම ය.

මේ සොළොස් දෙනා සළාක කැඳය, සළාක බතය, වස්සිවාසිකය, යනාදී වශයෙන් එක් කෙනා එක් දන බැගින් නිරතුරු ව දන් සොළොස් වර්ගයක් දීමට පුරුදුව සිටියෝ ය. මෙසේ පියා අනුව ම යන බැවින් ඔහුගේ දරුවෝ ද අනුජාත පුත්‍රයෝ යයි හඳුන්වනු ලැබූහ.

මෙසේ දැහැමෙන් සෙමෙන් පින් දහම් කරගෙන අඹුදරුවන් සමග සතුටින් විසූ ධම්මික උපාසකතුමා කල්යාමේ දී රෝගාතුර විය. ආයුෂ පිරිහී මරණාසන්න ද වූයේ ය. හෙතෙම බණ ඇසීමේ ආශාවෙන්, භික්ෂූන් වහන්සේලා කිහිප නමක් එවනු මැනවයි බුදුරදුන් වෙත ඇරයුමක් යැවී ය.

බුද්ධ නියමයෙන් භික්ෂූන් වහන්සේලා අටනමක් වැඩම කොට ඔහුගේ ඇඳ වටා වැඩ හුන්හ. භික්ෂූන් වහන්සේලාට නමස්කාර කළ උපාසකතුමා සූත්‍රයක් සජ්ඣායනා කරනු මැනවයි ඉල්ලා සිටියේ ය. ඔබ වඩාත් කැමති කුමන සූත්‍රයටදැයි ඇසූවිට සියලු බුදුවරුන් විසින් අත්නොහැර පුරුදු පුහුණු කරන ලද සතිපට්ඨාන සූත්‍රය දෙසනු මැනවැයි ඉල්ලා සිටියේ ය. උන්වහන්සේලා සූත්‍ර දේශනාව ආරම්භ කළහ.

ධම්මික උපාසකතුමා කොතරම් දැහැමි කෙනෙක් වීද යත් එතුමා මරණාසන්න වූ පුවත සියලු දෙවියන් අතර පැතිර ගියේ ය. දිව්‍ය ලෝක හයෙන් ම විසිතුරු ලෙස සැරසූ රිය හයක් පැමිණ ''අපේ ලොවට එන්න. අපේ ලොවට එන්නැයි" පෙරැත්ත කරන්නට වූහ. එය බණ ඇසුමට බාධාවක් වූ නිසා

''මදක් ඉවසන්න මදක් ඉවසන්නැ''යි උපාසක තුමා කීය. එය කීවේ තමාට යයි සිතූ භික්ෂූන් වහන්සේලා පිරිත නවතා විහාරයට වැඩියහ. පියා සිහිමුළාවෙන් දොඩවතියි සිතූ දරුවෝ වැලපෙන්නට වූහ. ඒ හඬට ඇස් හැර බැලූ උපාසකතුමා ආර්යයන් වහන්සේලා කොයිදැයි ඇසී ය. එවිට දරුවෝ සිදු වූ දේ කීහ.

ඒ ඇසූ උපාසකතුමා ''දරුවෙනි, මා මදක් ඉවසන්නැ''යි කීවේ ආර්යයන් වහන්සේලාට නොවේ. රිය ගෙනවුත් තම තම දෙව්ලොවට එන්-නැයි පෙරැත්ත කරන සදෙව්ලොව දෙවියන්ට '' යැයි කීය. '' පියාණෙනි අපට පෙනෙන රථයක් නැතැයි දරුවන් කීවිට මල්මාලාවක් ගෙන්වා ගත් උපාසකතුමා '' දරුවෙනි, වඩා හොඳ කුමන දෙව්ලොවදැයි ඇසී ය. '' සියලු බුදුවරුන් වාසයට තෝරා ගන්නා තුසිත දෙව්ලොව හොඳයැ''යි දරුවෝ කීහ. '' එසේ නම් තුසිත දෙව්ලොවෙන් ආ රියෙහි රැඳේවායි මල් මාලාව අහසට දමන්නැයි පියා '' කීය. ඔවුහු එසේ කළ හ. දැන් මහ ජනයාට මල් මාලාව පෙනේ. රථයක් නොපෙනේ.

අනතුරුව උපාසකතුමා රැස්ව සිටි පිරිස අමතා '' මම තුසිත දෙව්ලොවට යමි. අමුත්තක් නොසිතන්න. මා ළඟට එන්න කැමති අය මා කළා සේ පින්දහම් කරන්නැයි '' අවවාද කොට එම රථයට නැංගේ ය. මොහොතකින් ඔහුට තුන්ගව්වක් තරම් විශාල, අලංකාර අබරණින් සැරසුණු ආත්මභාවයක් පහළ විය. විමානය විසිපස් යොදුනක් විය. දහසක් දෙවඟනෝ එතුමා පිරිවරා ගත්හ.

එද විහාරයට වැඩි භික්ෂූන් වන්සේලාගෙන් උපාසකතුමන්ගේ තතු විමසූ බුදුරජාණන් වහන්සේට උන්වහන්සේලා සිදු වූ දේ සැළ කළහ. එවිට උන්වහන්සේ '' මහණෙනි, ධම්මික උපාසක තැන එසේ කීවේ අවසිහියෙන් නොවේ. ඔහුගේ පින් මහිමය නිසා කැඳවාගෙන යන්නට පැමිණි දෙවියන්ට '' යැයි වදළ විට '' එසේ නම් ස්වාමිනි, මේ පින්වත් උපාසකතුමා මෙලොවත් සුවෙන්, සතුටින් සිටියා වගේ ම දැන් පරලොව වඩාත් සතුටින් ඇතැයි '' භික්ෂූන් වහන්සේලා කීහ. ඒ වේලෙහි බුදුරජාණන් වහන්සේ එම කීම අනුමත කරමින් මේ ගාථාව දේශනා කළහ.

ඉධ මොදති පෙච්ච මොදති
කතපුඤ්ඤො උභයත්ථ මොදති
සො මොදති සො පමොදති
දිස්වා කම්ම විසුද්ධි මත්තනො

පින් කළ තැනැත්තා තමා කළ පිරිසිදු කුසල කර්ම සම්පත්තිය සලකා බලා ( ජීවිතයේ අවසාන සමයේ ) මෙලොවදී ම (කර්ම මෝදනාවෙන්) සතුටු වෙයි. පරලොවදී ඒ කර්මවලට අනුරූප සැප විපාක විඳින විට හෙතෙම ( විපාක මෝදනාවෙන් ) වඩාත් සතුටු වෙයි.

## 21.2 පොළොව නුහුලන අපරාධකරුවෙක්

බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට වැඩම වූ පළමු වතාවේ ම භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු කිම්බිල, දේවදත්ත, යන ප්‍රධාන පෙළේ කුමාරවරු සය දෙනාත් උපාලි නම් කරණවැමියාත් පැවිදි වූහ. ඒ අතුරින් උපාලි තෙරණුවෝ රහත් වී විනය ධරයන් අතර අග තනතුරට පත් වූහ. සෙසු ඇත්තන්ගෙන් භද්දිය තෙරණුවෝ එම වස් කාලයේදී ම රහත් වූහ. විතක්ක සණ්ඨාන සූත්‍රය අසා රහත් වූ අනුරුද්ධ තෙරණුවෝ දිවැස් අත්තවුන්ගෙන් අගතනතුර ලැබූහ. සෝවාන් ඵලයට පත් අනඳ තෙරණුවෝ බුද්ධෝපස්ථායක මෙන්ම ධර්ම භාණ්ඩාගාරික ද වූහ. භගු, කිම්බිල, දෙදෙනා වහන්සේත් ඉන් මෑත භාගයෙහි රහත් වූහ. ඉතිරි වූයේ දෙව්දත් තෙර පමණි. කිසිදු මාර්ග ඵලයක් නොලද උන් වහන්සේ ධ්‍යාන වඩා ඍද්ධි බලය පමණක් ලබා ගත්හ.

දෙව්දත් තෙර යශෝධරා දේවියගේ සොහොයුරා ය. පෘථග්ජන කම නිසා උන් වහන්සේ තමාටත් සසුනෙහි බලයක් තිබිය යුතු යැයි කල්පනා කළේ ය. තමා ඇතුළු ක්ෂත්‍රිය වංශිකයන් අපමණ සිටියදී සැරියුත් තෙරුන්, මුගලන් තෙරුන්, මහා කාශ්‍යප තෙරුන්, වැනි බ්‍රාහ්මණ වංශිකයන්ට සසුනේ මුල් තැන ලැබීම දෙව්දත් තෙර නොරිස්සුවේ ය. මේ නිසා ම උන්වහන්සේ වරක් භික්ෂු සංඝයාගේ පාලනය තමාට පවරන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම එකහෙළා ම ප්‍රතික්ෂේප කළහ. දෙව්දත් තෙර මේ භවයේදී මුලින් ම බුදුරදුන් කෙරෙහි වෛර බැඳ ගත්තේ මේ සිද්ධිය නිසා ය.

ඉන්පසු උන් වහන්සේ කෙසේ හෝ සංඝයාගේ පාලනය අතට ගන්නට තීරණය කළේ ය. ඒ සඳහා බලවන්තයෙකුගේ උපකාර අවශ්‍ය විය. බිම්බිසාර රජුගේ පුත් අජාසත්ත කුමරු සොයා ගිය උන් වහන්සේ ඍද්ධි ප්‍රාතිහාර්ය පෙන්වා ඔහු පහදවා ගත්හ. එහෙත් බුදුරදුන්ගේ පළමුවෙනි දායකයා වූ බිම්බිසාර රජතුමා සෝවාන් වූ ඉතා ශ්‍රද්ධා සම්පන්න උපාසකයෙකි. ඔහු සිටියදී තම බලාපොරොත්තුව ඉටු නොවන බව දෙව්දත් තෙරුන්ට පෙණුණි. ඒ නිසා අජාසත් කුමරු අමතා " කුමරුනි, ඔබ පියා මරා රජ වන්න. මම බුදුන් මරා බුදු වන්නෙමියි " කීහ.

අජාසත් කුමරු නොයෙක් වධ දී පියා මරා රජ විය. ඊළඟට දෙව්දත් තෙරුන්ගේ වාරය එළඹිණි. බුදුන් මැරීමට රජුගේ ද ආධාරය ඇතිව පළමු කොට දුනු වායන් යැවී ය. ගිය ගිය දුනු වායන් බුදුන් දැක පැහැදි පැවිදි වූ නිසා ඒ උපක්‍රමය අසාර්ථක විය. ඊළඟට නාලාගිරි ඇතුට රා පොවා බුදුරදුන් පාගා මැරීමට පෙර මගට යැවීය. එහෙත් බුදුරදුන්ගේ මෛත්‍රී බලයෙන් ඇතු දමනය විය.

අන්තිමේ දී බුදුරදුන් මැරීමේ කටයුත්ත තමා ම කරන්නට දෙව්දත් තෙර තීරණය කළේ ය. ඒ අනුව හෙතෙම ගිජුකුළු පර්වතය පාමුල සක්මන් කරමින් සිටි බුදුරදුන් මතට මහ ගලක් පෙරළී ය. ඒ ගල වෙනත් ගල් කුලක වැදී ඉවත විසි විය. එයින් කැඩී ආ පතුරක් වැදී බුදුරදුන්ගේ පාදයේ ලේ සෙළවිණි. මෙයින් හෙතෙම දරුණු ම පාප කර්මයන් වන පංචානන්තරිය පාප කර්මවලින් එකක් සිදු කර ගත්තේ ය.

ඊළඟට උන් වහන්සේ සිතුවේ සංඝයා තමාට පක්ෂපාතී කරගෙන බලය ලබා ගන්නට ය. ඊට උපක්‍රමයක් වශයෙන්

භික්ෂූන් වහන්සේ දිවි හිමියෙන් ආරණ්‍යක විය යුතු ය.
පිණ්ඩපාතික විය යුතු ය.
පාංශුකූලික විය යුතු ය.
වෘක්ෂ මූලික විය යුතු ය.
මත්ස්‍ය මාංශ අනුභවයෙන් වැළකිය යුතු ය.

යන වර පහක් පණවන ලෙස ඉල්ලීය. බුදුරජාණන් වහන්සේ කැමති කෙනෙක් ඒවා කරත්වා අකමැති කෙනෙක් නොකරත්වා යි එම ඉල්ලීම ද ප්‍රතික්ෂේප කළ සේක.

දෙව්දත් තෙරුන්ගේ බලාපොරොත්තුව ඉටු විය. මෙතරම් යහපත් ඉල්ලීම් පහක් බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ දෙව්දත් තෙරණුවෝ තමා ඒවා පිළිපදින බවත් ඊට එකඟ වන භික්ෂූන් වහන්සේලා තමා සමග එකතුවන ලෙසත් ඉල්ලා සිටියහ. පන්සියයක පමණ භික්ෂු පිරිසක් උන් වහන්සේට පක්ෂ වූහ. දෙව්දත් තෙර ඔවුන් රැගෙන සංඝයාගෙන් වෙන් වී ගයා ශීර්ෂයෙහි ආරාමයට ගියහ. එයින් සංඝ භේදය නම් තවත් ආනන්තරිය පාප කර්මයක් උන්වහන්සේ සිදු කර ගත්හ.

මේ පුවත බුදුරදුන්ට සැළ වී උන්වහන්සේ නොමග ගිය ඒ භික්ෂු පිරිස රැගෙන එන්නට දෑගසව්වන් වහන්සේලා පිටත්කර යැවූහ. උන් වහන්සේලා යන විට දෙව්දත් තෙර සිටියේ භික්ෂු පිරිසට බණ කියමිනි. බුදුරජාණන් වහන්සේ ළඟ මෙන් තමා දෙපස ඉඳගන්නා ලෙස කියා දෙව්දත් තෙර දෑගසව්වන්ට අසුන් පෙන්වී ය. එහෙත් උන්වහන්සේලා එහි හිඳ නොගත්හ. අනතුරුව දෙව්දත් තෙර තමාගේ පිට රිදෙන බව කියා බණ කීම සැරියුත් තෙරුන්ට පැවරීය. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනගත් දෑගසව්වන් වහන්සේලා නොයෙකුත් ප්‍රාතිහාර්ය පාමින් ධර්මය දේශනා කළහ. එයින් ඒ භික්ෂූහු සෝවාන් වූහ. අනතුරුව උන්වහන්සේලා ඒ පිරිසත් කැටිව අහසින් ම දෙව්රමට වැඩියහ.

මේ සිද්ධියෙන් දෙව්දත් තෙරුන්ගේ ප්‍රධාන අතවැසි වූ කෝකාලික තෙර කුපිත විය. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට පිරිස ගෙන යන්නට දීම ගැන පරොස් බසින් බැණ, සැතපී සිටි දෙව්දත්ගේ පපුවට දණහිසින් පහරක් දුන්නේ ය. එයින් දෙව්දත් තෙරුන්ට ලේ වමනය විය. එතැන් සිට නව මසක් ම දැඩිව ගිලන් ව සිටි උන් වහන්සේ මරණාසන්න විය. තමා කළ අපරාධ නිසා මහත් ළතැවිල්ලට පත් උන්වහන්සේට බුදුරදුන් වෙත ගොස් සමාව ඉල්ලන්නට උවමනා විය. තමා එහි ගෙන යන ලෙස ශ්‍රාවකයන්ට නියම කළේ ය. මුලදී අකමැති වූ ඔවුහු උන්වහන්ස්ගේ බලවත් ඉල්ලීම නිසාම ඇඳක තබා ගෙන දෙව්රම් වෙහෙරට ගෙන ගියහ. එහෙත් දෙව්රම් වෙහෙරෙහි පොකුණෙන් ඔබ්බට යන්නට නොලැබිණි. තම සව්වන් නාන්නට පොකුණට බැස්ස මොහොතෙහි ඇඳෙන් නැගිට දෙපා බිම තැබූ දෙව්දත් තෙරුන් පොළව පැලී ගිලී ගොස් අවීචි මහා නරකයේ උපන්නේ ය.

එසේ ගිලෙද්දී උන්වහන්සේ බුදුන් සරණ ගියේ ය. මේ කාරණය භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට සැළ කළහ. ඒ අවස්ථාවෙහි

උන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ ය.

ඉධ තප්පති පෙච්ච තප්පති
පාපකාරි උභයත්ථ තප්පති
පාපං මේ කතන්ති තප්පති
භියොා තප්පති දුග්ගතිං ගතො

පව්කම් කරන්නා ( පාප කර්මය කිරීමේදී ඇතිවන දොම්නසින් ) මෙලොවත් තැවේ. පරලොව දී ඒ කර්ම විපාකයෙන් දරුණු අපා දුක් විඳිමින් තැවේ. මෙසේ ඔහු දෙලොව ම තැවේ. මා විසින් පාපයක් කරණ ලදැයි මෙලොවදී තැවෙයි. දුගතියට ගිය විට එහි විපාක විඳිමින් වඩ වඩාත් තැවෙයි.

දෙව්දත් තෙර මෙවන් අපරාධ කළත් පෙර බොහෝ කල් පෙරුම් පිරූ කෙනෙකි. එහෙයින් කාලාන්තරයකට පසු නිරයෙන් මිදී අවුත් පින් දහම් පුරා මතු කාලයක සට්ඨිස්සර නම් පසේ බුදුවන්නේ යැයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

## 21.3 පියාණන් මලණුවන් වූ හැටි

අනේපිඬු සිටුතුමා බුදු සසුනෙහි අග්‍ර දායකයා විය. පනස් හතර කෝටියක් ධනය වැය කොට ජේතවනාරාමය ඉදි කරවූ එතුමාගේ ප්‍රධාන කටයුත්තක් වූයේ බුදුරජාණන් වහන්සේගේ පහසුව සැලසීම යි. එසේ ම එතුමාගේ නිවසෙහි දිනපතා භික්ෂූහු දෙදහසක් දන් වැළඳූහ. මේ අතර නගරයේ වෙනත් නිවෙස්වල පැවැත්වෙන දන පිංකම්වල මූලිකත්වය ගැනීමට හා සංවිධානය කිරීමට ද එතුමාට යන්නට සිදු විය.

අනේපිඬු සිටුතුමාට චූල සුභද්‍රා, මහා සුභද්‍රා, සුමනා යැයි දියණියෝ තිදෙනෙක් වූහ. තමා නැති අවස්ථාවල නිවසේ දන් වළඳන භික්ෂූන් වහන්සේලාට වතාවත් කළේ දෙටු දියණිය වූ මහාසුභද්‍රා ය. ඇය පති කුලයට ගිය පසු වතාවත් කළේ චූල සුභද්‍රා ය. මේ දෙදෙනා ම සෝවාන් වූ අය යි. සංඝයාගේ උපස්ථානය මැනවින් කළ ඇය ද පති කුලයට ගියා ය. අනතුරුව වතාවත් කළේ බාල දියණිය වූ සුමනා කුමරිය යි. සකෘදගාමී උපාසිකාවක

වූ සුමනා පති කුලයට නොගොස් කුමරියක ලෙස ම සිටියා ය. හදිසියේ රෝගාතුර වූ ඇය මරණාසන්න වූවා ය. ඒ මෙහොතේ ඇයට පියා දකින්නට උවමනා විය. එවිටත් අනේපිඬු සිටුතුමා සිටියේ දන් ගෙදරක ය. පණිවුඩය ලැබුණු සැණින් එතුමා වහා එහි ආවේ ය. දියණිය වෙත ලංවී '' දුව සුමනා-වෙනි, කිමද්ද''යි පියා විමසී ය. එවිට ඇය '' මළණුවනි, කොහි සිටියේද''යි විමසුවා ය. තමාට මළණුවන් යැයි කීවිට ඇගේ සිහි විකල් වී දෝ යි සිටුතුමාට සිතිණි. '' දියණියනි, නන් දෙඩවන්නේ ඇයි, බිය වූයේ ද''යි හේ ඇසී ය.

එවිට සුමනා කුමරිය ''මළණුවනි මම නන් නොදෙඩමි. බිය නොවුයෙමි''යි කියද්දී ම මිය ගියා ය. සිටුතුමාට දුවගේ වියෝව ඉවසිය නොහැකි දුකක් විය. ඒ මොහොතේ ඇය දෙඩවීම ගැන සිටුතුමා වඩාත් කම්පාවට පත් විය.

ඇගේ අවසන් කටයුතු නිම වූ සැණින් සිටුතුමා හඬමින් බුදුරදුන් හමුවට ගියේ ය. බුදුරජාණන් වහන්සේ '' ගෘහපතිය, මෙසේ දුක් දෙම්නසින් වැළපෙන්නේ මන්ද '' යි ඇසූහ. '' ස්වාමිනී, මාගේ දුව සුමනා දේවිය කළුරිය කළාය.'' යැයි කීය. '' ඉතින් ශෝක කරන්නේ මන්ද? මරණය ඒකාන්තය නොවේ දැයි '' බුදුරජාණන් වහන්සේ ඇසූහ. '' ස්වාමීනී, මම එය දනිමි. එහෙත් මෙතරම් සිල්වත් ව, ගුණවත් ව, විලිබිය ඇතුව විසූ මගේ දියණිය සිහි කල්පනාව නැතිව නන් දොඩවමින් මිය යාම මට ඉවසිය නොහැකි දුකකැ''යි සිටුතුමා කීය.

එවිට සියලු සිදුවීම අසා දැනගත් බුදුරජාණන් වහන්සේ '' සිටාණෙනි! ඔබේ දියණිය නන් දෙඩෙව්වා නොවේ. ඇය සකෘදගාමී ය. ඔබ සෝවාන් ය. ඔබට වඩා ඇය මාර්ග ඵලවලින් වැඩිමහලු නිසා ඔබට මළණුවනියි ඇමතුවා යැ'' යි කරුණු පැහැදිලි කර දුන්හ. එයින් ඉතා ප්‍රීතියටපත් සිටුතුමා ඈ කොහි උපන්නේදැයි ඇසීය. '' තුසිත භවනේ' යැයි වදාළ කල්හි '' ස්වාමිනී! මගේ දුව මෙහිදීත් පින් දහම් කොට ප්‍රීතියෙන් සිට, පරලොවත් සතුටුවන තැනක ම උපන්නේ නොවේද'යි '' කීය. බුදුරජාණන් වහන්සේ එය අනුමත කරමින් මේ ගාථාව වදාළ සේක.

ඉධ නන්‍දති පෙච්ච නන්‍දති
කත පුඤ්ඤො උභයත්‍ථ නන්‍දති
පුඤ්ඤං මේ කතන්ති නන්‍දති
භිය්‍යො නන්‍දති සුගතිං ගතො

පින් කළ තැනැත්තා මෙලොවත් ( පින් කරමින් ) සතුටු වේ. පරලොවත් ( විපාක විඳිමින් ) සතුටු වේ. මෙසේ හෙතෙම දෙලොවම සතුටු වෙයි. මෙලොවදී මම පිනක් කළෙමියි ( කර්ම ප්‍රීතිය ලබා ) සතුටු වෙයි. පරලොවදී සැප විපාක භුක්ති විඳින අතර ( අහෝ සැපයි, අහෝ සැපයි කියා විපාක ප්‍රීතියෙන්) වඩාත් සතුටු වේ.

## 21.4 මහණ එළයෙහි හිමිකරුවෝ

සැවැත් නුවර වැසි යහලුවෝ දෙදෙනෙක් නිතර පන්සල් යාමට බණ ඇසීමට පුරුදුව සිටියෝ ය. බණ අසා ගිහි ජීවිතයෙහි කළකිරුණු ඔවුන් දෙදෙනා පැවිදි වූහ. උන්වහන්සේලාගෙන් එක නමක් '' මා මහලු ය. ග්‍රන්‍ථ ධූරය පුරන්නට අපොහොසත් ය. විදර්ශනා ධූරය පුරමි.'' යි කියා රහත් බව දක්වා කමටහන් ලබාගෙන විවේක සෙනසුනක් බලා ගියේ ය. එහිදී බොහෝ වෙර වඩා සිව්පිළි සිඹියා සහිත රහත් බවට පැමිණියහ.

අනෙක් තෙර නම ග්‍රන්‍ථ ධූරය පුරමින් ත්‍රිපිටක බුද්ධ ධර්මය හදාළේ ය. දැන් උන්වහන්සේ ගිය ගිය තැන ධර්ම දේශනා කරති. පන්සියයක් භික්ෂූන්ට ධර්මය උගන්වති.

මේ අතර භික්ෂූන් වහන්සේලා ඉහත කී රහතන් වහන්සේ වෙත ගොස් අවවාද අනුශාසනා ලබමින් භාවනා පුහුණුව ලබති. රහත් වී කටයුතු නිමකළ භික්ෂූන් වහන්සේලා ඒ තෙරුන් වහන්සේ වැඳ පෙරළා බුදුන් දකින්නට යති. එවිට උන්වහන්සේ '' හොඳයි යන්න, මගේ වචනයෙන් බුදුන් වඳින්න, අසූ මහා සව්වන් වඳින්න, මගේ යහළු තෙරුන් හමු වී අපේ ආචාර්යයන් වහන්සේ ඔබ වඳිතියි කියන්නැයි '' පණිවුඩ යවති.

මෙසේ එන යන භික්ෂූන් බුදුන් වැඳ ශ්‍රාවකයන් වැඳ, ග්‍රන්ථ ධූරය පුරණ භික්ෂුවට ද වැඳ පණිවුඩය කියති. මෙසේ එන පිරිස වැඩිවන විට ත්‍රිපිටකධාරී භික්ෂුවට එය ඉවසා ගත නොහැකි විය. අපේ ගුරුතුමා ඔබ වඳිතියි කී කළ ඒ කවුදැයි අසයි. ඔබගේ යහළු තෙරුන් වහන්සේ යැයි කී විට ''උන්වහන්සේ ඔබට කළ ගුරුකම කුමක් ද? ඔවුන්ගෙන් උගත්තේ කුමක් ද? තුන් පිටකයෙන් එක් පිටකයක් හෝ නිකාය ග්‍රන්ථවලින් එක් නිකායක් හෝ උන්වහන්සේ දන්නවා ද? පැවිදි වූ ගමන් ම පාංශුකූල සිවුරු දරා කැලයට ගියේ ය. අතවැස්සෝ නම් බොහෝ ය. එහෙත් සතරපාද ගාථාවක්වත් නොදනිති '' යි හෙළා දැක උන්වහන්සේ පැමිණි විටකදී ප්‍රශ්න කරන්නට ද සිතා ගත්තේ ය.

කලකට පසු ඒ විදර්ශක තෙරුන් වහන්සේ පැමිණ යහළු තෙරුන්ගේ ආවාසයෙහි නවාතැන් ගත්හ. බුදුන් වැඳ අසූ මහා ශ්‍රාවකයන් වැඳ ආපසු ආවාසයට පැමිණි විට ත්‍රිපිටකධාරී තෙරණුවෝ තම අතවැසියන් ලවා සියලු වතාවත් කරවා සම අසුනක් ගෙන ප්‍රශ්න අසන රිසියෙන් උන්වහන්සේ ළඟ හිඳ ගත්හ.

මේ සිදුවීම දිවැසින් දුටු බුදුරජාණන් වහන්සේ මේ භික්ෂුව මේ රහතන් වහන්සේ වෙහෙස කරවා අපාගත වන්නේ යැයි දැන විහාර චාරිකාවේ වඩින ලෙසින් එතනට වැඩියහ. පැණවූ අසුනෙහි වැඩ සිටි බුදුරජාණන් වහන්සේ පළමුවෙන් ම ත්‍රිපිටකධාරී ආවාසික භික්ෂුවගෙන් ධ්‍යාන සමාපත්ති ගැන ප්‍රශ්න විචාළහ. එහෙත් පිළිතුරු නොළැබිණි. විදර්ශනා භික්ෂූන් වහන්සේ ඊට පිළිතුරු සැපයූහ. අනතුරුව සෝවාන් මාර්ගය ගැන ප්‍රශ්න කෙරිණි. එයට ද ත්‍රිපිටකධාරී භික්ෂුව නිරුත්තර විය. සෙසු මාර්ග ගැනත් පිළිවෙළින් විචාළහ. ග්‍රන්ථ ධූරය පිරූ භික්ෂුවට ඒ එකකටවත් පිළිතුරු දිය නොහැකි විය. විදර්ශක රහතන් වහන්සේ සියල්ල මැනවින් විසඳාලූහ. ඒ සෑම අවස්ථාවකදී ම බුදුරජාණන් වහන්සේ සාධුකාර දුන්හ.

ඒ සාධුකාරය අසා බුමාටු දෙවියන්ගෙන් පටන් ගෙන බඹලොව දක්වා සාධුකාරය පැතිර ගියේ ය. ත්‍රිපිටකධාරී භික්ෂූන් වහන්සේට ප්‍රශංසාවක්වත් නොලැබිණි. මේ ගැන උන්වන්සේගේ අතවැසියන් අතර කතා බහක් ඇති විය. එවේලෙහි බුදුරජාණන් වහන්සේ '' මහණෙනි, ඔබගේ ත්‍රිපිටකධාරී ගුරුවරයා කුලියට හරකුන් බලන ගොපල්ලෙකු වැනි ය. ඒ

ගොපල්ලා පස් ගෝ රසයට හිමකම් නොලබන්නා සේ ඔබගේ ගුරුවරයා ද ගරු බුහුමන්වලට හිමිකාරයෙකු වුවත් මගපලවලට හිමිකාරයෙකු නොවී ය''.

'' එහෙත් මේ විදර්ශක රහතන් වහන්සේ පස්ගෝරසය පරිභෝග කරන ගව හිමියෙකු මෙන් ධර්මය ද අවබෝධ කරගෙන මගඵලවලට ද හිමිකරුවෙකු වූයේ '' යැයි වදරා මේ ගාථා දෙක දේශනා කළ සේක.

බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපොව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති

බොහෝ බණ දහම් ඉගෙන ගෙන එය දෙසන නමුත් එ ධර්මයට අනුව නොපිළි පදින ( නම්බු නාම තනතුරු ලාභ ප්‍රසංසාවලින් සතුටු වී ) ප්‍රමාදව වෙසෙන පුද්ගලයා අනුන්ගේ ගවයන් රැක බලාගෙන ගණන් කර බාර දෙන ගොපල්ලෙකු මෙන් මහණකමේ ඵලයට ( මගඵල වලට ) හිමි කරුවෙක් නොවන්නේ ය.

අප්පම්පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී
රාගං ච දොසං ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්ත චිත්තො
අනුපාදියානො ඉධ වා හුරංවා
ස භාගවා සාමඤ්ඤස්ස හොති

බණ දහම් ස්වල්පයක් දැනගෙන අනුන්ට දෙසන කෙනෙකු වුවත් ( සිල් පුරමින් ඉන්ද්‍රිය සංවරයෙන් යුතුව කමටහන් ගෙන බවුන් වඩමින් ) ධර්මානුකූල ව හැසිරෙන්නේ වේ නම් රාගය, ද්වේශය, මෝහය දුරුකළ විදර්ශනා නුවණින් සංස්කාර ධර්මයන්ගේ තතු මනාව දන්නා කෙනෙකු වේ නම්, මනාව මිදුණු සිත් ඇති, මෙලොව හෝ පරලොව සම්බන්ධ කිසිවෙක් '' මමයි මාගේ ය '' යැයි දැඩිව නො ගන්නා කෙනෙකුත් වේ නම් හෙතෙම මහණකමේ හිමිකරුවෙක් වන්නේ ය.

## අභ්‍යාසය

01. යමක වග්ගයට එම නම යෙදීමේ යුක්තිය පහදන්න.

02. යමක වග්ගයේ එන ධර්මකාරණා කුසල - අකුසල වශයෙන් තීරු දෙකට බෙදූ සටහනක් පිළියෙල කර පන්තිකාමර බිත්තියේ එල්ලන්න.

03. යමක වගගයේ කුසල පක්ෂයේ ගාථාව එක් අසුනකටත්, අකුසල පක්ෂයේ ගාථාව අනෙක් අසුනකටත් භාර දී යුගාසන ධර්ම දේශනා පුහුණුවක යෙදෙන්න.